**විසර්ජන ශීර්ෂය 273- පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

## 1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කටයුතු සම්බන්ධීකරණය හා මෙහෙයවීම.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය රජයේ ප්‍රධාන සම්බන්ධීකරණ ආයතනය වශයෙන් රජයේ සංවර්ධන වැඩ සටහන් හා ව්‍යාපෘති රජයේ නියමයන්ට අනුව ක්‍රියාත්මක කිරීම, ප්‍රගති සමාලෝචනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.

(ඇ) එක් එක් අවස්ථාවල දී පනවන ලද ව්‍යවස්ථාපිත අණපනත්වලින් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම.

(ඈ) ජනතාවගේ නීතිය හා සාමය පවත්වාගෙන යාමටත්, ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමටත් රජයේ ආරක්ෂක අංශ සමඟ සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම.

(ඉ) රජයේ විවිධ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශවල දිස්ත්‍රික්කයේ ප්‍රධාන නියෝජිත ආයතනය වශයෙන් ඔවුන්ගේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය කිරීම.

(ඊ) රජයේ ආදායම් ගණන්දීම සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරියා වශයෙන් රජයේ ආදායම් එකතු කිරීම හා ගිණුම් ගත කිරීමේ කටයුතුවල නිරතවීම.

## 1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

(අ) වෙන්නප්පුව
(ආ) නාත්තන්ඩිය
(ඇ) හලාවත
(ඈ) ආරච්චිකට්ටුව
(ඉ) පුත්තලම
(ඊ) කල්පිටිය
(උ) වනාතවිල්ලුව
(ඌ) කරුවලගස්වැව
(එ) නවගත්තේගම
(ඒ) ආණමඩුව
(ඔ) මහකුඹුක්කඩවල
(ඕ) දංකොටුව
(ක) මාදම්පේ

(ඛ) පල්ලම
(ග) මුන්දලම
(ඝ) මහවැව

## 1.3 විගණන විෂය පථය

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජුනි 26 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන, මෙහි (අ) සිට (ඈ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.15 දක්වා ඡේද වල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පාඩු හා හානි ලේඛනය | මු.රෙ. 110 |
| දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා | මු.රෙ. 1646 |

**(ආ) විසර්ජන ගිණුම**

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.545,934,726ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.501,927,342ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.44,007,384ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 08ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 378,500,000 | 443,734,726 | 4,563,666 | 01 |
| මූලධන | 102,200,000 | 102,200,000 | 39,443,718 | 39 |
| එකතුව | 480,700,000 | 545,934,726 | 44,007,384 | |

**(ii) අයවැය විචලනය**

- වැය විෂයයන් 02ක් සඳහා සළසා තිබුණු රු.50,000ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

- වැය විෂයයන් 17ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10ත් සියයට 80ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(iii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජන**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 22ක් විසින් එකතුව රු.2,635,989,690ක් ද, දෙපාර්තමේන්තු 16ක් විසින් රු.990,567,363ක් වශයෙන් රු.3,626,557,053ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එකතුව රු.3,234,056,926ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. අමාත්‍යාංශ 02ක් විසින් ලබාදී තිබුණු එකතුව රු.524,000ක ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම නිසා එම ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණි. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණු රු.2,474,241,601කින් ද, ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණු රු.21,773,265කින් ද හා සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබුණු රු.520,103,265ක ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.196,127,673ක් ද, රු.10,450,150ක් ද හා රු.110,810,529ක් උපයෝජනය කර නොතිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

විෂය අංක 27301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 50,000,000 | 46,328,899 | 25,000,000 | 54,298,105 | 190,000,000 | 141,063,856 |

විෂය අංක 27301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිටි තිබුණු ශේෂවල එකතුව රු.3,896,236ක් වූ අතර, එයින් වර්ෂ 2ට වැඩි හිඟ හිටි ණය ශේෂ 25ක එකතුව රු.1,297,683ක් විය.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

2012 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ ශේෂවල එකතුව රු.265,542,126ක් විය.

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 02ක් ඉක්මවූ රු.8,265,866ක් වූ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13ක පොදු තැන්පත් ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 215(3) හි විධිවිධාන ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය නොමැතිව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වැය නොකළ වියදම් ලෙස ගිණුම්ගත කර, එකතුව රු.2,866,036ක් පොදු තැන්පතු ගිණුමට මාරු කර තිබුණි.

## 1.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.6.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03ක් සඳහා සංයුක්ත සැලැස්මක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේ දී පිළියෙල කළයුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත්, පිළියෙල කර නොතිබුණි.

### 1.6.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

ඉහත 1.6.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.6.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.6.4 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12කට අදාලව අභ්‍යන්තර විගණන විමසුම් 12ක් නිකුත් කර තිබුණු අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සම්බන්ධයෙන් කිසිදු අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

සිදුකළ අභ්‍යන්තර විගණනයන්වලදී අනාවරණය වූ අඩුපාඩු හා අභ්‍යන්තර පාලන දුර්වලතා නිවැරදි කිරීමට හා ඉදිරියේදී සිදු නොවීමට සිදුකළ පසු විපරම් තත්ත්වය හා ගනු ලැබූ ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 1.6.5 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පැවැත්විය යුතු වුවත්, රැස්වීම් වාර 02ක් පවත්වා තිබුණි.

### 1.7 වත්කම් කළමනාකරණය

**නිෂ්ක්‍රීය වත්කම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු ගොඩනැගිලි 02ක්, වර්ෂ 05ක කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

### 1.8 අනුකූල නොවීම්

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **මුදල් රෙගුලාසි** | -- | |
| | මු.රෙ.104(1) | | වාහන 2කට සිදුවී තිබූ අලාභය තක්සේරු කර මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | මු.රෙ.880 | -- | සේවක ඇප තබා නොතිබුණි. |

(ආ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2007 ඔක්තෝබර් 05 දිනැති අංක රා.පරි/ගි/1/5.වැ දරන චක්‍රලේඛය | -- | විශ්‍රාම වැටුප් ගෙවීමේදී ජීවත්වීමේ සහතික පිළිබඳ තොරතුරු ලබාගත යුතු වුවද, තොරතුරු ලැබීමේ අවිධිමත්භාවයන් පැවතුණි. |

(ඇ) **රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2008 මාර්තු 13 දිනැති අංක PF-427 දරන චක්‍රලේඛය | -- | වාහනයක් රක්ෂණය කර නොතිබුණි. |

(ඈ) **වෙනත් චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| (I) | 2012 පෙබරවාරි 16 දිනැති අංක ආස/සං/ගම නැගුම සමස්ථ අධීක්ෂණය/2012 ලිපියේ 03 ඡේදය | 10,000,000 | මාර්ග සංවර්ධන හා කුඩා පරිමාණයේ ග්‍රාමීය යටිතල පහසුකම් ව්‍යාපෘතිවලට අදාළව නුපුහුණු ශ්‍රමය සඳහා ප්‍රජා දායකත්වය ලබාගෙන නොතිබුණි. |
| (II) | 2003 සැප්තැම්බර් 25 දිනැති විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකගේ ලිපිය | 151,348 | හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2012 වර්ෂය තුළ අවස්ථා 07කදී විශ්‍රාමිකයින් මියයාමෙන් පසුව ද, ඔවුන්ට හිමි විශ්‍රාම වැටුප බැංකු ගිණුම් වෙත යවා තිබූ නමුත්, එම මුදල් සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

**1.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳ විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු. 1,238,367ක ඇස්තමේන්තු පිරිවැයකින් යුතු මාවතක් කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියක් 2012 දෙසැම්බර් 12 දින ආරම්භ කළ යුතු වුවත්, එම මාර්ගය ජල ව්‍යාපෘතියන්ට අදාළව බට එළීම අවසන් වන තෙක් ආරම්භ කිරීමට නොහැකිවීම නිසා එය ක්‍රියාත්මක කිරීමට කොන්ත්‍රාත්කරු ඉදිරිපත් වී නොතිබුණි.

**(ආ) ව්‍යාපෘති නිම කිරීම ප්‍රමාද වීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත්, එම ව්‍යාපෘති වර්ෂය තුළ නිම කරගත නොහැකි වී තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය (ප්‍රජා දායකත්වය සමඟ) | ආරම්භ කල දිනය | 2012 දෙසැම්බර් 31 දින වන විට වියදම | ප්‍රමාද වීමට හේතුව |
|---|---|---|---|---|
| | රු. | | රු. | |
| අලුත්වැව ප්‍රතිසංස්කරණය කිරීම | 1,215,729 | 2012.09.05 | 600,745 | ගොවිජන දෙපාර්තමේන්තුවෙන් ඇස්තමේන්තු සැකසීම ප්‍රමාද වීම හා අයහපත් කාලගුණය |
| පානීය ජල ව්‍යාපෘතිය- වැලිපැලැස්ස | 1,200,000 | 2012.12.17 | 590,352 | ඉඩම පවරා ගැනීම ප්‍රමාද වීම හා වර්ෂය අවසානයේ ඇති වූ අයහපත් කාලගුණය |
| කුඹුක්වැව ජල ටැංකි ඉදිකිරීම | 11,030,274 | 2012.12.13 | 38,105 | වර්ෂය අවසානයේ දී ගිවිසුම්ගත වීම නිසා කාලය ප්‍රමාණවත් නොවීම. |
| වඩත්ත නායික්කුලම ගම්මානය ජලය සැපයීම (ජල ටැංකිය) | 615,695 | 2012.11.21 | -- | අයහපත් කාලගුණය |
| බෙනිල් මාවත ඉතිරි මාර්ග කොටස ප්‍රතිසංස්කරණ කිරීම හා පැති බැම්ම ඉදිකිරීම | 1,000,000 | 2012.12.10 | -- | අයහපත් කාලගුණය |

| | | | | |
|---|---|---|---|---|
| මරද මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 1,207,816 | 2012.06.18 | 556,043 | |
| ගරාජ් මාවත ප්‍රතිසංස්කරණය කිරීම | 1,159,749 | 2012.07.20 | 6,894 | |
| ගරු ආතර් මාටින් පියනම මාර්ගය දෙවන අදියර ප්‍රතිසංස්කරණය කිරීම | 619,637 | 2012.07.27 | 74,922 | |
| බංකඩ හංදියේ ශාන්ත මරියා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 1,217,824 | 2012.11.15 | 840,304 | |
| එරබදුගහවත්ත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 1,207,816 | 2012.11.18 | -- | |
| මීනි කනත්ත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 1,207,816 | 2012.11.28 | 936,132 | තාක්ෂණ නිලධාරියකු නොමැති වීම. |
| කටුගොඩ වෙල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 1,208,724 | 2012.07.19 | -- | |
| ලුඩ්ස් මාවත ප්‍රතිසංස්කරණය කිරීම | 1,210,887 | 2012.08.02 | 934,940 | |
| තල්ගහකටුව මාර්ගය තාර දැමීම | 606,790 | 2012.10.30 | 546,111 | |
| පන්සල් ජනපද මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 1,101,011 | 2012.07.06 | 932,786 | |
| ජල බැසයන කානු පද්ධතිය සංවර්ධන කිරීම (තුන්මෝදර) | 1,255,633 | 2012.11.14 | 36,223 | |
| ඉහළ කොට්ටාමුල්ල අල්හිරා මාවත සංවර්ධනය | 1,154,584 | 2012.06.25 | 112,889 | |

| | | | | |
|---|---|---|---|---|
| මීඩ්ලන්ඩ් මාර්ගය සංවර්ධනය කිරීම | 1,023,138 | 2012.10.15 | 781,681 | තාක්ෂණ නිලධාරීයකු නොමැති වීම. |
| තිත්ඇල්ල මාර්ගය සංවර්ධනය කිරීම | 1,085,158 | 2012.11.16 | 781,681 | |
| නාරවිල පාසල අසල සිට කුද්දෙටියාව විහාරස්ථානය දක්වා මාර්ගය තාර දැමීම | 1,090,319 | 2012.11.12 | 654,600 | |
| මාතෘ හා ළදරු සායන ගොඩනැගිල්ල සංවර්ධනය | 1,084,241 | 2012.10.10 | 163,134 | |
| මිරිස්ස කැලේ මාර්ගය සංවර්ධනය කිරීම | 1,140,314 | 2012.12.03 | 36,469 | |
| මාවිල වත්ත 1 හරස් වීදිය ප්‍රතිසංස්කරණය | 1,139,052 | 2012.12.27 | -- | |
| නාරවිල පෙර පාසල සංවර්ධනය කිරීම | 1,109,000 | 2012.11.19 | 54,770 | |
| දන්දෙණිය වත්ත ජනපදය සුළු හා පාරම්පරික මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම | 1,139,399 | 2012.07.07 | 860,027 | |

## 1.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

**ගැලැපුම් කළ යුතු ශේෂ**

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2012 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශ අනුව නිකුත් කළ නමුත්, බැංකුවට ඉදිරිපත් නොවූ කල් ඉකුත් වූ රු.42,375ක් වටිනා චෙක්පත් 07ක් සම්බන්ධයෙන් මු.රෙ. 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එමෙන්ම සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණු ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.6,213ක් හා රු.37,828ක් 2012 දෙසැම්බර් 31 දින වන විටත්, ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 1.11 අවිධිමත් ගනුදෙනු

<u>අධිකාරී බලය නොමැති වූ ගනුදෙනු</u>

(i) 2012 වර්ෂය තුළදී කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ධාවනය කළ වාහන 02ක් සඳහා ඉන්ධන ඇණවුම් භාවිතා නොකර රු.50,691ක ඉන්ධන ලබාගෙන තිබුණි.

(ii) වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ වේලි ආරක්ෂණ ව්‍යාපෘතිය හරහා තබ්බෝව පානීය ජල සැපයුම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදුන් මුදලින් රු.1,936,347ක් වියදම් කර තිබූ නමුත්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරයාගේ විධිමත් අනුමැතියක් ලබාගෙන තිබූ බවට විගණනයට සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි.

## 1.12 වංචනික ස්වරූපයේ ගනුදෙනු

මහකුඹුක්කඩවල හා වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පාසල් සංවර්ධන වැඩ සටහන් සඳහා රු.113,525ක මුදලක් වැයකළ බවට ගෙවීම් වාර්තාවල ව්‍යාජ ලෙස තොරතුරු ඇතුළත් කර ඉටු නොකළ වැඩ සඳහා මුදල් ලබාගෙන තිබුණි.

## 1.13 අනාර්ථික ගනුදෙනු

2012 වර්ෂයේ දී කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පාසල් සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන වශයෙන් ලැබුණු රු.1,000,000ක මුදලකින් රු.102,809ක මුදලක් ඉතිරි කරගෙන ගෙවීම් සිදුකර තිබූ බැවින් අදාළ කාර්යය සම්පූර්ණ කර ගැනීමට නොහැකිව තිබුණි.

## 1.14 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දංකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විමධ්‍යගත අයවැය ආයෝජන අරමුදල මඟින් 2010 හා 2011 වර්ෂවලදී කිරිමැටියාන මැටි කර්මාන්ත කරුවන්ගේ සමුපකාර සමිතිය වෙත ලබාදී තිබූ රු.250,000ක් නිෂ්ක්‍රීය වියදමක් බවට පත්ව තිබුණි.

(ආ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ මූලා ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කරන **"එක් ගමකට එක් වැඩක්"** ව්‍යාපෘතිය යටතේ නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් මානිංගල පානීය ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. 2011 වර්ෂය තුළදී රු.675,456ක වියදමින් ළිඳ හා ජල පොම්පාගාරය ඉදිකර තිබූ අතර, 2012 වර්ෂයේ දී රු.939,000ක වියදමින් අවශ්‍ය උපකරණ සපයා තිබුණි. ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය විසින් 2012 ජුනි 13

දින මෙම ජල මූලාශයේ ජලය පානීය ජලය සඳහා යොදා ගැනීමට නුසුදුසු බවට නිර්දේශ කර තිබූ හෙයින්, ඒ වෙනුවෙන් දරන ලද රු.1,614,456ක් වියදම නිෂ්ඵල වියදමක් බවට පත්ව තිබුණි.

(ඈ) නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින්, 2012 විමධ්‍යගත අයවැය අරමුදල මඟින් මාරවිල උතුර මුදුකටුව කාන්තා සංවිධානයකට ස්වයං රැකියා සඳහා චක්‍රීය අරමුදලක් ඇරඹීම සඳහා රු.50,000ක් ගෙවා තිබුණි. විගණන අවස්ථාව වූ 2013 පෙබරවාරි 06 දින වන විටත් චක්‍රීය අරමුදල ආරම්භ කර නොතිබූ අතර, 2013 ජනවාරි 16 දින එම මුදලින් රු.40,000ක් සමිතියේ භාණ්ඩාගාරික විසින් බැංකුවෙන් ඉවත් කර ගෙන තිබුණි.

(ඇ) 2012 වර්ෂයේ විමධ්‍යගත ආයෝජන හා ගම නැඟුම ව්‍යාපෘති මඟින් කල්පිටිය, පල්ලම හා මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංවර්ධන වැඩ සටහන් වෙනුවෙන් එකතුව රු.636,322ක් වටිනා භාණ්ඩ හා උපකරණ ලබාදී තිබුණි. 2013 මාර්තු වන විටත්, එම භාණ්ඩ හා උපකරණ බෙදා දී නොතිබුණි.

(ඉ) 2012 වර්ෂයේ ගම නැඟුම ව්‍යාපෘති යටතේ නවගත්තේගම, මහකුඹුක්කඩවල හා කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල කර්මාන්ත පරීක්ෂාවන්වලදී වටිනාකම රු.2,087,641ක් වූ ව්‍යාපෘති 02ක අධීක්ෂණ දුර්වලතා පැවතුණි. එසේම ව්‍යාපෘති 12ක ඉටුනොකරන ලද කාර්යයන් වෙනුවෙන් රු.510,511ක් ගෙවීම් කර තිබුණි.

(ඊ) මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාමික නිලධාරීන් 28 දෙනෙකු වෙත මාසික විශ්‍රාම වැටුප් වශයෙන් රු.687,101ක් වැඩිපුර ගෙවා තිබුණි. එම වැඩිපුර ගෙවූ මුදල් 2012 සැප්තැම්බර් මස සිට වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කර තිබුණද, ඒ පිළිබඳ විස්තර විශ්‍රාම වැටුප් ලිපිගොනුවලට ඇතුළත් කර නොතිබුණි. විශ්‍රාම වැටුප් වශයෙන් රු.94,778ක් වැඩිපුර ගෙවා තිබූ එක් විශ්‍රාමිකයෙකුගේ ලිපි ගොනුව 2013 ජනවාරි මාසයේ දී බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යවා තිබුණද, වැඩිපුර ගෙවූ මුදල්වලින් අය කරගත යුතු මුදල් පිළිබඳ විස්තර දන්වා යවා නොතිබුණි.

එසේම, කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විශ්‍රාමිකයින් දෙදෙනෙකු මිය යාමෙන් පසුවද මාස 08ක් වෙනුවෙන් රු.125,225ක විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි.

(උ) ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත කාන්තා සංවිධාන සාමාජිකාවන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම සඳහා චක්‍රීය ණය අරමුදලක් ආරම්භ කිරීම ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් 1996 වර්ෂයේදී ලබාදී තිබූ රු.180,000ක අරමුදල් අක්‍රීයව පැවතුණි. 2013 මාර්තු මාසයේ දී සිදුකරන ලද විගණන පරීක්ෂණය සඳහා ඊට අදාල ලිපි ලේඛන කිසිවක් ඉදිරිපත් කර

නොතිබුණි. එමෙන්ම 2005 වර්ෂයේ දී චක්‍රීය අරමුදලක් ආරම්භ කිරීම සඳහා ලබාදී තිබූ රු.200,000ක අරමුදලින් රු.67,100ක් 2008 මැයි 15 දිනට බැංකුවේ තැන්පත් කර තිබූ අතර, ඉන් පසුව 2013 අප්‍රේල් දක්වා එම ගිණුම අක්‍රීයව පැවති අතර, සාමාජිකාවන් වෙත ණය වශයෙන් නිකුත් කර තිබූ ඉතිරි රු.132,900ක මුදල ද එදින සිට අක්‍රීයව පැවතුණි.

**1.15 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛාව**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 55 | 43 | 12 | -- |
| (ii) | තෘතියික මට්ටම | 34 | 15 | 19 | -- |
| (iii) | ද්විතියක මට්ටම | 998 | 761 | 237 | -- |
| (iv) | ප්‍රාථමික මට්ටම | 172 | 160 | 12 | -- |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | -- | 07 | -- | 07 |
| (vi) | අභ්‍යාසලාභී උපාධිධාරී | 1,387 | 1,228 | 159 | -- |
| | | 2,646 | 2,214 | 439 | 07 |